# පශ්චාත් පෙටක ප්‍රාග් අට්ඨකථා යුගයේ පාලි සාහිත්‍යය

ඩබ්.එම්. දේශප්‍රිය ගුණසේන

පාලි සාහිත්‍යයේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී දළ වශයෙන් එය යුග කිහිපයකට බෙදා දක්වනු ලැබේ. ඒ අනුව බුද්ධ කාලීන යුගයටත්, සංගායනා යුගයටත් පසු ව එළැඹෙන්නේ පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයයි. මෙම යුගයට කලින් පැවති සාහිත්‍ය උපදාර්ගය සහ උනන්දුව සලකා බලන විට අවුරුදු 800ක තරම් පමණ වූ මෙම කාල පරිච්ඡේදය පාලි සාහිත්‍ය සංවර්ධනයේ නිහඬ යුගයක් නො වූ බවට සැක නැත. මීට පෙර රචිත වූ කථාවත්ථුප්පකරණය ආදී ග්‍රන්ථ සාහිත්‍යමය වශයෙන් පැවැති විශාල උනන්දුවක ස්වරූපය ගෙන හැර දක්වයි.

මීට පෙර යුගයෙහි පාලි සාහිත්‍යයේ නොතිබූ ඇතැම් විට පසු කාලීන යුගයන්හි පවා දක්නට නොලැබෙන සාහිත්‍යය පිළිබඳ වූ උනන්දුව මෙම යුගය තුළ පැවැති බව එවක රචිත යැයි පිළිගැනෙන ග්‍රන්ථයන්ගෙන් සනාථ වෙයි. පළමු කොට ම පශ්චාත් පේටක හා ප්‍රාග් අට්ඨකථා යුගයේ ලියැවුණු ධර්ම සාහිත්‍යමය ග්‍රන්ථ කිහිපයක් පොදුවේ විද්වතුන් අතර පිළිගැනේ. එනම්,

1. නෙත්තිප්පකරණ
2. පෙටකෝපදෙස
3. මිලින්දපඤ්හ
4. සුත්තසංගහ යනුයි.

මෙයින් පළමු වැන්න හා දෙවැන්න ත්‍රිපිටකය අධ්‍යයනය කිරීමෙහි ලා ක්‍රමවත් අධ්‍යයන පිළිවෙළක් ඉදිරිපත් කරන ග්‍රන්ථයන් ය. නෙත්තිප්පකරණ හා පේටකෝපදේස යන ග්‍රන්ථ ද්වය ම ක්‍රමානුකූල ව ත්‍රිපිටකය හැදෑරීමට මග පෙන්වන ග්‍රන්ථයෝ වෙති. මෙම ග්‍රන්ථ දෙකින් පේටකෝපදේසය වඩා පැරණි ය. එහි කර්තෘත්වය කච්චායන හිමියන්ට පැවරේ. ග්‍රන්ථයෙහි ම හෙළි වන පරිදි මෙය පිටක අධ්‍යයනය පිළිබඳ ව